# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

**53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා**

දුරකථන / ෆැක්ස් : **2556629** ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/මැහැර/217/19 ඔබේ අංකය :

2019.11.01

සී.ඩී. වික්‍රමරත්න මැතිතුමා,<br>
ගරු වැඩබලන පොලිස්පති,<br>
පොලිස් මූලස්ථානය,<br>
කොළඹ 01.

<u>ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන් මැතිවරණ රාජකාරී යෙදවීමේදී ප්‍රවාහන පහසුකම් සැලසීම.</u>

01. මැතිවරණ විශේෂ රාජකාරී සඳහා යොදවනු ලබන ප්‍රධාන පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් නිසි පරිදි සැපයීම සිදුනොවීම හේතුවෙන් එම නිලධාරීන් පත්වන අපහසුතාවයන් පිළිබඳව කරුණු ඇතුලත් අභියාචනයක් පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය වෙත ඉදිරිපත් කර ඇත.

මැතිවරණ විශේෂ රාජකාරී සඳහා ප්‍රධාන පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන් සේවා ස්ථානයේ සිට වෙනත් කොට්ඨාශවලට පිටව යාමේදීත්, රාජකාරී ස්ථානයේ සිට විශේෂ රාජකාරී සඳහා යොදවනු ලබන ස්ථානයන් වෙත ගමන් කිරීමේදීත් පොදු ප්‍රවාහන සේවය භාවිතා කිරීමට සිදුවීම හේතුවෙන් ඉතාමත් අපහසුතාවයන්ට මුහුණ පෑමට සිදුවන බවට සඳහන් කර ඇත.

**නිලධාරීන් විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයේ පිටපතක් මේ සමග යා කොට ඇත.**

02. මේ අනුව මැතිවරණ විශේෂ රාජකාරී යොදවන ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන්ගේ ඉහත අභියාචනය සලකා බලා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා දෙන ලෙස ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

ප්‍රගීත් ප්‍රේමසිරි,<br>
පොලිස් පරීක්ෂක,<br>
ලේකම්,<br>
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

ගරු ලේකම්<br>
පොලිස් පරීක්ෂක සංගමය

පිටපත : අධ්‍යක්ෂතුමා / මැතිවරණ කොට්ඨාශය.